# පුරප්පාඩු

## ශ්‍රී පාලි මණ්ඩපය - කොළඹ විශ්වවිද්‍යාලය

ශ්‍රී පාලි මණ්ඩපයෙහි පුරප්පාඩුව පවතින පහත තනතුරු සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන්
2026 අප්‍රේල් මස 07 වැනි දින දක්වා අයදුම්පත් භාර ගනු ලැබේ .

01.වැඩ සහායක (තාවකාලික පදනම)

සුදුසුකම් :

1.අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම

වයස : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

වෙනත් : සෑම අයදුම්කරුවකුම,

අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ආ) තනතුරේ කාර්යභාරය සාර්ථකව ඉටු කිරීම සඳහා ශාරීරිකව සහ මානසිකව යෝග්‍ය විය යුතුය.

ඇ) මනා චරිතයකින් යුතු විය යුතුය.

මාසික වැටුප : රු.42,775/- + රු.17,800/- (ජීවන වියදම් දීමනාව ) +ETF+UPF

සේවා කාලය : මාස 06

බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් සහ/හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**<u>කොන්දේසි සහ ප්‍රතිලාභ:</u>**

1. තෝරා ගනු ලබන අයදුම්කරු තාවකාලික පදනම මත මාස 06 ක කාලයකට බඳවා ගනු ලැබේ. සේවා කාලය සතුටුදායක නම් සේවා දිගුවක් සඳහා සලකා බලනු ලැබේ. මෙම පත්වීම ලබන අපේක්ෂකයින් ස්ථිර පත්වීම් සඳහා සුදුසුකම් නොලබයි.
2. අපේක්ෂකයින් කෙටි ලැයිස්තු ගත කිරීම හා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම විශ්වවිද්‍යාලයේ අභිමතය පරිදි සිදුවේ.
3. තෝරාගත් අපේක්ෂකයා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජිකයෙකු වනු ඇත. ඔහුගේ /ඇයගේ මාසික වැටුපෙන් 10% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට දායක වන අතර ඒ සමඟම,සේවා යෝජකයා විසින් සේවකයාගේ වැටුපෙන් 15% කට සමාන මුළු දායකත්වයක් ලබා දෙනු ඇත.
4. 1980 අංක 46 දරණ සේවක භාර අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව විශ්වවිද්‍යාලය විසින් වැටුපෙන් 3% ක් සේවක භාර අරමුදලට දායක කරයි.
5. බඳවා ගැනීමට අදාල අනෙකුත් කොන්දේසි 16/1978 දරණ විශ්වවිද්‍යාල පනත හා එහි අනෙකුත් සංශෝධන, නියමාවලි, නීති හා රෙගුලාසි වලට අනුකූල වේ.

අයදුම්පත් එවිය යුතු ආකාරය

1. ඉහත තනතුර සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන අයදුම්කරුවන්ට ශ්‍රී පාලි මණ්ඩපයේ වෙබ් අඩවියෙන් (https://spc.cmb.ac.lk) ආදර්ශ අයදුම්පතක් බාගත (Download) කළ හැකිය.

2. සම්පූර්ණ කරන ලද අයදුම්පත, සත්‍ය පිටපත් බවට සනාථ කරන ලද අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් වලට අදාල සහතික පිටපත් සමග ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය, වැවල, හොරණ යන ලිපිනයට 2026 අප්‍රේල් 07 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

3. අයදුම්පත බහා එවනු ලබන ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

4. අසම්පූර්ණ, අපැහැදිලි, අදාල සනාත කිරීම් සිදු නොකළ, සහතික වල පිටපත් අමුණා නොමැති හෝ ප්‍රමාද වී එවනු ලබන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර එවැනි අයදුම්පත් කිසිදු හේතුවක් මත යළි සලකා බලනු නොලැබේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, ශ්‍රී පාලි මණ්ඩපය, වැවල,හොරණ.
ලේඛකාධිකාරී කොළඹ විශ්වවිද්‍යාලය වෙනුවට
23.03.2026